## අවසාන ප්‍රතිඵලය කුමක්ද?

කරන ලද පැමිණිල්ලක් සාධාරණ බවට අයි.ජී.අයි.එස්. තීරණය කරයි නම් හෝ ආයතනයක් සම්බන්ධ සම්පූර්ණ පරීක්ෂණ වාර්තාවක් මගින් ආයතනය දෝෂදර්ශනයට ලක් කෙරේ නම්, අයි.ජී.අයි.එස්. විසින් ආයතන ප්‍රධානියා සහ වගකිවයුතු අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කල යුතුය.

ආයතනයක් විසින් තීරණයක් නැවත සලකා බලන ලෙස හෝ වෙනස් කරන ලෙස, සිය රීතීන් හෝ පටිපාටීන් වෙනස් කරන ලෙස, සිය තීරණයක් හෝ ක්‍රියාවක් හේතුවෙන් සිදුවුණු පාඩුවකට වන්දි ගෙවන ලෙස නිර්දේශ කිරීමට අයි.ජී.අයි.එස්. හට හැක.

අයි.ජී.අයි.එස්. විසින් කරන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා හෝ ආයතන බැඳී නොසිටියද, සාමාන්‍යයෙන් ඔවුන් ඒ අනුව කයුතු කරයි. සිය වාර්තාව සම්බන්ධයෙන් අමාත්‍යවරයා හෝ ආයතනය විසින් කරන ලද දෙය සම්බන් ධයෙන් අයි.ජී.අයි.එස්. සතුටු නොවේ නම්, අයි.ජී.අයි.එස්. විසින් අග්‍රාමාත්‍යවරයා වෙත හෝ පාර්ලිමේන්තුව වෙත වාර්තා

## ඔබට අයි.ජී.අයි.එස්. හා සම්බන්ධ විය හැක්කේ කෙසේද?

පැමිණිල්ලක් කිරීම සම්බන්ධයෙන් ගාස්තු අය කිරීමක් හෝ නිශ්චිත ක්‍රමයක් නැති වුවද, සාමාන්‍යයෙන් පැමිණිල්ල ලිඛිතව දෙන ලෙසත් හැකි තරම් තොරතුරු සපයන ලෙසත් ඉල්ලා සිටිය හැක.

ඔබට පැමිණිල්ලක් කිරීමට අවශ්‍ය නම්, අයි.ජී.අයි.එස්. වෙත දුරකථනයෙන් ඇමතීම හෝ ලිපියක් යැවීම මගින් කල හැක (අනෙක් පිටුවේ ඇති සම්බන්ධවීමේ තොරතුරු බලන්න)

පැමිණිලි ඉංග්‍රීසි භාෂාවෙන් කිරීම යෝග්‍යවේ.

ඔබට අයි.ජී.අයි.එස්. සමඟ ඊමේල් මගින් වුවද සම්බන්ධ විය හැක. නමුත් ආරක්ෂක හේතු මත අප විසින් යවන ලිපි තැපැල් මගින් යැවීම සිදුවිය හැක.

අයි.ජී.අයි.එස්. විසින් කරන කාර්යයන් සම්බන්ධ වැඩිදුර විස්තර අපගේ වෙබ් අඩවියේ ඇත (www.igis.gov.au).

## සම්බන්ධවීම සඳහා විස්තර


Inspector-General of Intelligence and Security
PO Box 6181
KINGSTON ACT 2604

දුරකථන: 02 6271 5692
ෆැක්ස්: 02 6271 5696
ඊමේල: info@igis.gov.au
වෙබ් අඩවිය: www.igis.gov.au


September 2005

IGIS
Inspector-General of Intelligence and Security

# ඔස්ට්‍රේලියාවේ බුද්ධිමය සහ ආරක්ෂක ආයතන සම්බන් ධව පැමිණිල්ලක් කිරීම

## අයි.ජී.අයි.එස්. යනු කවුරුන්ද?

බුද්ධිය සහ ආරක්ෂාව පිළිබඳ අධිපති (The Inspector-General of Intelligence and Security (IGIS)) විසින් ඔස්ට්‍රේලියාවේ පහත සඳහන් බුද්ධිමය සහ ආරක්ෂක ආයතන සම්බන්ධ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීමත් සමාලෝචනය කිරීමත් සිදු කරයි

- ඔස්ට්‍රේලියානු ආරක්ෂක බුද්ධිමය සංවිධානය (ඒ.එස්.අයි.ඕ)
- ඔස්ට්‍රේලියානු රහස් බුද්ධිමය සේවාව (ඒ.එස්.අයි.එස්.)
- ඩිෆෙන්ස් සිග්නල්ස් ඩිරෙක්ටරේට් (ඩී.එස්.ඩී.)
- ඩිෆෙන්ස් ඉමේජරි සහ ජියෝස්පැටියල් සංවිධානය (ඩී.අයි.ජී.ඕ.)
- ආරක්ෂක බුද්ධිමය සංවිධානය (ඩී.අයි.ඕ) සහ
- ජාතික තක්සේරු කාර්යාලය (ඕ.එන්.ඒ.)

අයි.ජී.අයි.එස්. යනු ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන ස්වාධීන පුද්ගලයෙකි. අයි.ජී.අයි.එස්. අනිකුත් සියළුම ආයතනවලින් ස්වාධීනවේ.

**දැනට අයි.ජී.අයි.එස්. ලෙස කටයුතු කරන්නේ ඉයන් කාර්නෙල් මහතා වන අතර ඔහුව පත් කරන ලද්දේ 2004 මාර්තු මාසයේදීය.**

## අයි.ජී.අයි.එස්. කරන්නේ කුමක්ද?

1986 බුද්ධිය සහ ආරක්ෂාව පිළිබඳ ඉන්ස්පෙක්ටර් ජෙනරාල් පනත යටතේ අයි.ජී.අයි.එස්. විසින් අදාල ආයතන විසින් පහත සඳහන් කාර්යයන් කරන බවට ඔස්ට්‍රේලියානු රජයට, පාර්ලිමේන්තුවට සහ ප්‍රජාවට ස්වාධීන තහවුරුවක් ලබාදේ.

- සිය කාර්යයන් ඔස්ට්‍රේලියානු නීතියට අනුව ඉටු කරන බව
- නිසි ආකාරයට හැසිරෙන බව
- අමාත්‍ය මාර්ගෝපදේශයන් සහ විධානයන් අනුව කටයුතු කරන බව සහ
- මානව හිමිකම්වලට ගරු කරන බව

අයි.ජී.අයි.එස්. කරන කාර්යයන්:

- **ආයතනවල වාර්තාවන් පරීක්ෂා කිරීමට** නිතිපතා එම ආයතන වෙත යාම
- ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධ විශේෂ පරීක්ෂණ පැවැත්වීම
- ආයතන සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම
- විමර්ශනයන්හි ප්‍රතිඵල අමාත්‍යවරුන් හට, අග්‍රාමාත්‍ය වරයා හට සහ පාර්ලිමේන්තුවට **වාර්තා කිරීම**

## අයි.ජී.අයි.එස්. විසින් ඔබට ලබාගත හැක්කේ කුමක්ද?

බුද්ධිමය තොරතුරු රැස් කරන ආයතන වන ඒ.එස්.අයි.ඕ., ඒ.එස්.අයි.එස්., ඩී.එස්.ඩී. හෝ ඩී.අයි.ජී.ඕ. සම්බන්ධ පැමිණිල්ලක් ඔබ හට කල හැක.

රහස්‍යභාවය පිළිබඳ දැඩි රීතීන් ඇති අවස්ථාවල වුවද (ඒ.එස්.අයි.ඕ. මගින් ප්‍රශ්න කිරීම හෝ රඳවා තබා ගැනීමේ වරෙන්තු ආදිය) ඔබ විසින් පැමිණිල්ලක් කරන අවස්ථාවල අයි.ජී.අයි.එස්. වෙත තොරතුරු ලබා දිය හැක.

- නීති විරෝධී ලෙස දුරකථනවලට සවන් දීම
- අයෝග්‍ය ලෙස පුද්ගලයන් රහසිගතව ලුහුබැඳීම
- සෝදිසි කිරීමේදී අයෝග්‍ය ලෙස ක්‍රියා කිරීම
- දුර්වල බඳවා ගැනීමේ පටිපාටි
- වීසා අයදුම්පත් සම්බන්ධ ආරක්ෂක පරීක්ෂාවන් සම්බන්ධ ප්‍රමාද සහ ලේඛණගත කර ඇති ලියවිලි
- සම්බන්ධ ප්‍රවේශයට කරන ලද අයදුම්පත් සම්බන්ධ ප්‍රමාද

ඔස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිසිය හෝ සංක්‍රමණ බලධාරීන් සම්බන්ධ **පැමිණිලි පරීක්ෂා කිරීමට අයි.ජී.අයි.එස් හට නොහැක**. මේවා සම්බන්ධයෙන් කටයුතු කල හැක්කේ **කොමන්වෙල්ත් ඔම්බඩ්ස්මන්වරයා** හටය.

## සියළුම පැමිණිලි විමර්ශණය කරන්නේද?

පැමිණිල්ලක් විමර්ශනය කිරීමට තීරණය කිරීමේදී, අයි.ජී.අයි.එස්. විසින් පහත කරුණු සැලකිල්ලට ගනී:

- පැමිණිලි කල කාරණය ඇත්තෙන්ම බුද්ධිමය හෝ ආරක්ෂක ආයතනයකට අදාල කරුණක්ද යන්න
- සිද්ධිය සිදුවී කොපමණ කාලයක් ගතවී ඇතිද යන්න
- අදාල ආයතනය විසින් දැනටමත් පරීක්ෂණයක් කර ඇතිද හෝ කරමින් සිටීද යන්න
- අදාල කාරණය විමර්ශනය කිරීමට වඩා සුදුසු වෙනත් පුද්ගලයකු සිටීද යන්න සහ
- අදාල කාරණය විමර්ශනය කිරීමට තරම් වැදගත්ද යන්න

## ඔබ පැමිණිල්ලක් කල පසු කුමක් සිදුවේද?

ඔබගේ පැමිණිල්ලට නිසි අවධානය ලබාදේ.

තොරතුරු ලබා ගැනීමට අයි.ජී.අයි.එස්. හට පුළුල් බලතල ඇති අතර පහත දෑ සිදු කල හැක:

- යම් පුද්ගලයෙකු හට යම් ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට හෝ ලියවිලි ඉදිරිපත් කිරීමට නියම කල හැක
- දිවුරුම් මත සාක්ෂි ලබා ගත හැකි අතර
- බුද්ධිමය සහ ආරක්ෂක ආයතනවලට ඇතුළු විය හැක.

ප්‍රාථමික පරීක්ෂණයක් මගින් හෙළිදරව් වන්නේ ස්වල්පයක් නම් හෝ නොගතයුතු දෙයක් නම්, අයි.ජී.අයි.එස්. විසින් සාමාන්‍යයෙන් සති කිහිපයක් ඇතුලත ඔබ වෙත දැනුම් දෙනු ඇත.

සම්පූර්ණ පරීක්ෂණයක් අවශ්‍ය නම්, කොපමණ කරුණු පරීක්ෂා කල යුතුද යන්නත් කී දෙනෙකු හා සම්මුඛ පරීක්ෂණ පැවැත්විය යුතුද යන්නත් යන කරුණු මත වඩා දිගු කාලයක් ගතවේ.

**අයි.ජී.අයි.එස්. විසින් සිදු කරන පරීක්ෂණ සහ විමර්ශණ,** ජාතික ආරක්ෂාව සම්බන්ධ සංවේදී කරුණු ඇති නිසා, **පුද්ගලිකව සිදු කෙරේ.**

විශේෂ හේතු නොමැති අවස්ථාවක, අදාල ආයතනය සම්බන්ධ පැමිණිල්ලක් ඇති බවට එම ආයතනය වෙත දැනුම් දෙන අතර එම ආයතනයෙන් ඒ සම්බන්ධ ප්‍රතිචාරයක් ලබා ගනී.

කෙසේ වුවද, පාර්ලිමේන්තුව වෙත යන වාර්ෂික වාර්තා වැනි මහජන වාර්තාවල සාමාන්‍යයෙන් පැමිණිල්ල යොමු කරන අයගේ නම සඳහන් නොකරයි.